# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2115/20 – 2019 මාර්තු 19 වැනි අඟහරුවාදා – 2019.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/10/72/2013.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2018.03.28 දිනැති හා අංක 2064/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.03.22 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දෙල්ගොඩ, කඳුබොඩ, නො. 80 සී හි පදිංචි අසේල ගුණවර්ධන මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, සෙත්සිරිපාය, 6 වන මහල හි පිහිටි නාගරික සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.10.26 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/10/72/2013.

**කාර්මික අධිකරණයේ දී ය.**

අසේල ගුණවර්ධන මයා,
අංක 80 සී,
කඳුබොඩ,
දෙල්ගොඩ.
(ඉල්ලුම්කාරිය)

නඩු අංකය : ඒ/25/2018

සහ

නාගරික සංවර්ධන අධිකාරිය,
6 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.
(වග උත්තරකරු)

**ප්‍රදානය**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මැණික්දිවෙල, ශ්‍රී පේමරතන මාවත, නො. 22/1, එස්. ජී. සූරියආරච්චි වන මා 2018.03.22 වැනි දින පත්කොට මෙම ආරවුල මා වෙත යොමුකර ඇත.

1. ඇමතිවරයාගේ බලය පැවරීම මගින් බලය පවරා ඇති බව,
2. කම්කරු කොමසාරිස් විසින් යොමු කිරීම,
3. විභාගය ආරම්භ කළ ආකාරය.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ ;

''නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කරන අසේල ගුණවර්ධන මහතාට ගෙවන ලද අවදානම් දීමනාව 2012.06.25 දින සිට නතර කිරීමෙන් අසාධාරණයක් සිදුව තිබේද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම්, ඔහුට හිමි විය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ.''

දෙපාර්ශවයේ පෙනී සිටීම වනුයේ ඉල්ලුම්කරු වෙනුවෙන් තමාම පෙනී සිටි අතර, වගඋත්තරකාර ආයතනයේ සහකාර අධ්‍යක්ෂගේ බලය පැවරූ ලිපිය සහිතව ලිපිකාරිණී පූර්ණිමා මල්වැන්න මහත්මිය පෙනී සිටි.

මෙම නඩුවේ ඉල්ලුම්කාර පාර්ශවය විසින් අවදානම් දීමනාව අඛණ්ඩව ගෙවන ලෙසටත්, විශ්‍රාම යාමෙන් පසු ද එකී දීමනාව හිමිකම් කියාපෑමට නෛතිකව අවකාශ ඇති බවටත් කම්කරු කොමසාරිස් ජනරාල් වෙත ඉල්ලීමක් කර ඇත. නැවත අඛණ්ඩව ගෙවීම් කළ යුතු බවට කම්කරු කොමසාරිස් ජනරාල් විසින් 2016.11.09 වැනි දිනැති ලිපියෙන් දන්වා ඇති නමුත් මෙම ඉල්ලීම පිළිබඳ ගැටළුව සඳහා නිසි ප්‍රතිචාර වගඋත්තරකාර නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් නොලැබී ඇති බැවින්, ඉල්ලුම්කාර පාර්ශවයේ ඉල්ලීම සම්බන්ධව කාර්මික අධිකරණයේ සාමාජික බේරුම්කරුවකු වෙත මෙම ආරවුල 2018.02.05 දින යොමු කර ඇති බවත් නිරීක්ෂණය කළෙමි.

ඉල්ලුම්කාර පාර්ශවය අවදානම් දීමනාව ඉල්ලීම සම්බන්ධයෙන් වගඋත්තරකාර පක්ෂයේ ස්ථාවරය විමසා බැලීමට පියවර ගෙන ඇති අතර ඒ සම්බන්ධව වගඋත්තරකාර නාගරික සංවර්ධන අධිකාරිය කරුණු දක්වමින් ඉල්ලුම්කරු නාගරික සංවර්ධන අධිකාරියට අයත් මොණරාගල ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කළ වර්ෂ 2012.06.25 සිට 2015.04.30 දක්වා කාලය සඳහා පමණක් අවදානම් දීමනාව ගෙවිය හැකි බව ද වගඋත්තරකාර පක්ෂය ස්වකීය 2018.05.02 දිනැති ලිපියෙන් දන්වා ඇති බවත් නිරීක්ෂණය කළෙමි.

තව ද වගඋත්තරකාර පාර්ශවයේ ස්ථාවරය දනුම් දීමෙන් අනතුරුව ඉල්ලුම්කරු විසින් 2018.05.21 දාතමින් කාර්මික අධිකරණය වෙත යොමු කර ඇති ලිපියට අනුව වගඋත්තරකාර පක්ෂය විසින් සඳහන් කර ඇති පරිදි මොණරාගල කාර්යාලයේ සේවය කළ කාලය එනම්, 2012.06.25 දින සිට 2015.04.30 දක්වා කාලය වෙනුවෙන් පමණක් අවදානම් දීමනාව ලබා ගැනීමට එකඟ බවත්, තවදුරටත් මෙම ආරවුල ඉදිරියට ගෙන යාමට අපේක්ෂා නොකරන බවටත් සඳහන් කර ඇති අතර එයද නිරීක්ෂණය කළෙමි.

ඒ අනුව මෙම නඩුවේ පාර්ශවයන් එනම් ඉල්ලුම්කාර අසේල ගුණවර්ධන මයා සහ වගඋත්තරකාර නාගරික සංවර්ධන අධිකාරිය කාර්මික අධිකරණය ඉදිරියට කැඳවූ අතර, ඉල්ලුම්කරුගේ ඉල්ලීම සම්බන්ධව 2018.05.02 දෙපාර්ශවය අතර සමථයක් තිබේ දැයි විමසන ලදුව සමථයකට එනම් ඉල්ලුම්කරු නාගරික සංවර්ධන අධිකාරියට අයත් මොණරාගල ප්‍රාදේශීය කාර්යාලයේ සේවය කළ කාලයට පමණක් අවදානම් දීමනාව ලබාගෙන ආරවුල සමථයකට පත්කර ගැනීමට කැමැත්ත පළ කළ අතර වගඋත්තරකාර පාර්ශවය ද ඊට කැමැත්ත පළ කරන ලදී.

අනතුරුව ගෙවීම් කිරීම සඳහා 2018.08.16 දින දෙපාර්ශවය පැමිණිය යුතු බවට නියෝග කළත් එදින නඩුව විභාග නොවිණ. එබැවින් 2018.08.30 මෙම නඩුව නැවත කැඳවන ලදී. එදින වගඋත්තරකාර පක්ෂය පෙනී නොසිටි බැවින් නැවත 2018.09.12 දිනට මෙම නඩුව මා විසින් කැඳවීමටත් එදිනම අවදානම් දීමනාව ගෙවන ලෙසටත් නියම කළ අතර, එදින වගඋත්තරකාර පක්ෂය ඉල්ලුම්කරු වෙත අවදානම් දීමනාව චෙක්පතකින් ගෙවීමට ඉදිරිපත් වූ නමුත් චෙක්පතෙහි දෝෂයක් නිසා අවදානම් දීමනාව ඉල්ලුම්කරු වෙත ගෙවීමක් සිදු නොවීය.

එබැවින් අවදනම් දීමනාව ඉල්ලුම්කරු වෙත ගෙවීමටත් එලෙස අවදානම් දීමනාව ගෙවීමෙන් පසු නඩුව අවසන් කිරීම සඳහා නිවැරදි ව අදාළ අවදානම් දීමනාව ගෙවීම සඳහා පියවර ගන්නා ලෙස වගඋත්තරකාර පාර්ශවයට නියෝග කරමින් 2018.09.19 දින නැවත නඩුව කැඳවීමට නියෝග කළ අතර 2018.09.19 දින දෙපාර්ශවය නඩුව සඳහා පෙනී සිටි අතර, සමථයක් ලෙස වගඋත්තරකාර පක්ෂය ඉල්ලුම්කරුට රු. 106,569.70ක් මුදලින් ගෙවීමෙන් පසු දෙපාර්ශවය නඩු පොතේ අත්සන් තැබූ බවත් ඒ අනුව සමථයට පත් වූ නඩුව අවසන් කරමි.

තව ද, මෙම සමථය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව නිගමනය කරමි.

එස්. ජී. සූරියආරච්චි,
බේරුම්කරු.

වර්ෂ 2018 ක් වූ ඔක්තෝබර් මස 26 වැනි දින,
9 වන මහල,
කම්කරු මහලේකම් කාර්යාලයේ කාර්මික අධිකරණයේ දී ය.

04 - 55

---

මගේ අංකය: IR/COM/03/K/2015/158.

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.07.11 දිනැති හා අංක 2079/40 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.07.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් හොරණ, මූනගම, තක්ෂිලා උයන, අංක 199 හි පිහිටි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අසාධාරණයට ලක් වූ සේවකයින්ගේ සංගමය (සේවකයන් 05 දෙනෙකු වෙනුවෙන්) හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 03, ගෝල්ෆේස් ටෙරස්, අංක 25 හි පිහිටි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2019.01.23 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,

කොළඹ 05.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ
අධිකාරියේ අසාධාරණයට ලක් වූ
සේවකයින්ගේ සංගමය,
අංක 06,
ග්‍රීන් රේන්ජ්
පතිරණ මාවත,
වැලිගම්පිටිය,
පොකුණුවිට, හොරණ.

ඉල්ලුම්කරුවන්

ඒ/44/2018
IR/COM/03/K/2015/158

සහ

ජාතික මැණික් හා ස්වර්ණාභරණ
අධිකාරය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්,
කොළඹ 03

වගඋත්තරකාර පාර්ශ්වය

**ප්‍රදානයයි**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා ගරු අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 38 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2018.07.03 වන දින මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත දෙපාර්ශවය අතර පවත්නා කාර්මික ආරවුලට හේතු වී පවත්නා කරුණ වූයේ " ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සේවය කළ බී. එම්.එච්. බී.බස්නායක, කේ.ඩී.සුනිල් සමරසිංහ, කේ. එස්.පෙරේරා, ජේ.එච්. දයාසේන, ජී.ඒ. ජයරත්න යන සේවක මහතුන් හට වයස 60 දක්වා සේවය කිරීමට අවස්ථාව තිබියදී ඊට පෙර ඔවුන් විශ්‍රාම ගැන්වීමෙන් ඔවුන්ට යම් අසාධාරණයක් සිදුවූයේ ද? එසේ නම් ඔවුන්ට හිමි විය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.

මෙම කරුණ විභාගයට ගැනීමට පෙර කාර්මික ආරවුල් පනත යටතේ නියෝග සංග්‍රහයේ 21(1) දරන නියෝගයෙන් දැක්වෙන පරිදි මෙම ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව දෙපාර්ශවය විසින් ඉදිරිපත් කරන ලද සම්පූර්ණ විස්තර ප්‍රකාශයේදී වග උත්තරකාර පාර්ශවය විසින් මූලික විරෝධතාවයක් ගෙන ඇත. ඊට පිළිතුරු ප්‍රකාශ ඉල්ලුම්කරුවන් විසින් ද ඉදිරිපත් කොට ඇත. වග උත්තරකාර දෙවන පක්ෂයේ විරෝධතාවයට හේතු ලෙස පහත සඳහන් කරුණු ඉදිරිපත් කොට ඇත. එනම්

(i) ජාතික මැණික් හා ස්වරණාභරණ අධිකාරියේ විවිධ කාලයන් තුළ සේවය කළ සේවකයින් කීපදෙනෙකු වයස 55, 56, 57, 59 දී අවිධිමත් ලෙස සේවයෙන් විශ්‍රාම ගැන්වූයෙන් තමන්ට අගතියක් වූ බවට පැමිණිල්ලක් කරන බව;

(ii) යොමුවේ සඳහන් සේවකයන් පස්දෙනා කරන ලද පැමිණිල්ලක් මත රත්නපුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය මගින්ද පරීක්ෂණයක් පැවැත්වෙන බව,

(iii) එකී පරීක්ෂණය පැවැත්වෙන අතරතුර කම්කරු කොමසාරිස් ජෙනරාල්වරයා වෙත පැමිණිලි කිරීමේ ශක්‍යතාවයක් නොපවත්නා බව,

(iv) ටී.කේ. ජයසූරිය නමැති අය මෙම කරුණ සම්බන්ධයෙන්ම බොරැල්ල කම්කරු විනිශ්චය සභාව වෙත පැමිණිලි කොට නියෝගයක් මත සහනයක් ලබා ඇති බව.

(v) රත්නපුර කම්කරු කාර්යාලය වෙත පැමිණිලි කළ කේ. පියතිලක මහතා හැර සෙසු සියලු දෙනා නියමිත වයස සම්පූර්ණ වීමෙන් අනතුරුව එක් එක් චක්‍රලේඛ මත විශ්‍රාම ලැබූ බව

(vi) මෙම සියලුම සේවකයින් විශ්‍රාම ගන්වා ඇත්තේ " රාජ්‍ය ව්‍යාපාර/ දෙපාර්තමේන්තු චක්‍ර ලේඛයන්ට අනුව බව,

(vii) මෙහි එක් සේවකයකු හැර අනිකුත් සියලු දෙනා නියමිත කාලයේදී කම්කරු විනිශ්චයාධිකාරියක් වෙත පැමිණිලි කොට සහනයක් ලබා ගැනීමට අපොහොසත් වූ බව,

(viii) ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලීම කල් ඉකුත්වී ඇති බව,

(ix) ජාතික මැණික් හා ස්වරණාභරණ අධිකාරිය පිහිටුවන ලද 1993 අංක 50 දරන පනතේ අධිකාරියේ සේවකයන් විශ්‍රාම ගැන්වීමේ නිසි වයස සීමාවක් ලිඛිතව සඳහන් නොවූ බව,

(x) 1971 අංක 13 දරන රාජ්‍ය මැණික් සංස්ථා පනතේ 5(2) වගන්තිය අනුව සංස්ථාවේ කාර්ය කර්තව්‍යය ඉටු කිරීම සඳහා පත් කරන ලද සේවක මණ්ඩලයේ සේවා කොන්දේසි සම්බන්ධයෙන් සංස්ථාව විසින් තීරණය කළ යුතු බවට නියමයක් පවත්නා හෙයින් මෙම ඉල්ලුම්කරුවන් විශ්‍රාම ගැන්වීමේ තීරණය සඳහා අධිකාරිය සතු බලය සම්බන්ධයෙන් පාර්ශවයන් බැඳී සිටින බව හා පාර්ශවයන් ප්‍රතිබන්ධනය වී ඇති බව,

(xi) විශ්‍රම ගන්වන ලද සියලු සේවකයන් තත්කාලයේ වලංගුව පවතින ලද චක්‍රලේඛ මත විශ්‍රාම ගන්වා ඇති බව,

(xii) වග උත්තරකාර ආයතනයේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි වන පේශල ජයරත්න බණ්ඩාර යන අය අත්සන් කොට 2018.08.07 දිනැති අංක NGIA9/ වයස අවුරුදු 55- 60 දරන මූලික විරෝධතාවයේ xxii දරන සම්ප්‍රකාශය මෙසේය.

"මේ අනුව පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු විමසීම සඳහා 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත ප්‍රකාරව කම්කරු කොමසාරිස්වරයාට බලතල නොමැති බවට මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරමින් මෙම පැමිණිල්ල මුල් අවස්ථාවේදීම ප්‍රතික්ෂේප කළ යුතු බවට ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය වෙනුවෙන් ප්‍රකාශ කර සිටින බව" යන ප්‍රකාශය සම්බන්ධයෙන් බේරුම්කරණය විරුද්ධ වේ. පනතේ මුල් වාක්‍ය "කාර්මික ආරවුල් පනත කාර්මික ආරවුල් වැළැක්වීම, විමර්ශනය කිරීම සහ නිරවුල් කිරීම සඳහාද ඒ හා සම්බන්ධ හෝ ඊට අනුශාංගික හෝ කරුණු සඳහා ද විධි විධාන සැලැස්වීම පිණිස වූ පනතකි" යන පාඨයෙන් ඊට පිළිතුරු ලැබේ. එසේ හෙයින් එකී සම්ප්‍රකාශය මෙම විරෝධතාවය තහවුරු කිරීම සඳහා කෙසේ අදාළ වේදැයි නොහැඟේ.

(xiii) එහෙත් විරෝධතාවය සම්බන්ධ අනිකුත් කරුණු අතරින් ඉල්ලුම්කරුවන්ගේ විශ්‍රාම වයස් සීමාව කිසිදු සේවා ගිවිසුමකට හෝ අධිකාරි පනතේ ලිඛිතව සඳහන් නොවීම,

(xiv) ඉල්ලුම්කරුවන්ගේ විශ්‍රාම වයස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ සහ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත රඳා පවතින බව,

(xv) අවුරුදු 57 දක්වා වසරින් වසර සේවා දිගු ලබාදීම පාලක මණ්ඩලය විසින් අනිවාර්යයෙන් කළ යුත්තක් බවට පනතේ සඳහන් නොවීම,

(xvi) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 60 ප්‍රකාරව" වසර 57 ඔබ්බට වසර 60 දක්වා කාලයක් සේවය කිරීමට" අදාළ සේවකයා ඉල්ලීමක් කරන අවස්ථාවලදී එම ආයතනය සඳහා වන සේවා අවශ්‍යතාවය හා සේවකයාගේ කාර්ය සාධනය යන කරුණු සැලකිල්ලට ගෙන වසරින් වසර සේවා දිගු ලබාදීමට රාජ්‍ය ව්‍යවසායකයාගේ පාලක මණ්ඩලයට ක්‍රියා කළ හැක" යන ප්‍රතිපාදනය සැලකිල්ලට ගතිමි.

(xvii) විශ්‍රාම ගැන්වීමේ වයස ඉක්ම වූ කීපදෙනකු සඳහා සේවය දීර්ඝ කිරීමට හේතුව කම්කරු විනිශ්චයාධිකාරියේ තීරණ අනුව බවත්,

(xviii) 2016.06.21 දිනැති මූලික විරෝධය සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්වරයා සිය 2016.11.09 දින " ඉල්ලීම් දෙකක් සම්බන්ධයෙන් එකම අවස්ථාවක සලකා බැලිය නොහැකි බැවින් ......... කේ . පියතිලක යන අයගේ ඉල්ලීම වෙනම ඉල්ලීමක් වශයෙන් සලකා බැලෙන බවත්, අනෙකුත් ඉල්ලුම්කරුවන් සම්බන්ධයෙන් වෙනම ලිඛිත දේශන ඉදිරිපත් කළ යුතු බවත්,

(xix) කම්කරු කොමසාරිස් විසින්ද මෙම ආරවුල සජීවී ආරවුලක් නොවන බවට තීරණය කිරීම ආදී ජාතික මැණික් හා සවර්ණාභරණ අධිකාරිය ඉදිරිපත් කරන ලද කරුණ සැලකිල්ලට ගත් අතර ඉල්ලුම්කාර පළමු පාර්ශවය ගෙනෙන ලද කරුණු ද මෙහිදී සැලකිල්ලට ගන්නා ලදී.

එනම්,

(i) තම වෘත්තීය සමිතියට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111 පරිච්ඡේදයේ 14(1) ඇ වගන්තිය ප්‍රකාරව මූලික අයිතිවාසිකමක් පවතින බව,

(ii) ඉහත සමිතියේ සාමාජිකයින් වූ නමුත් මෙහි වගඋත්තරකාර අධිකාරියේ සේවය කළ බව,

(iii) වර්ෂ 2018 ක් වූ අගෝස්තු මස දින රහිත අසාධාරණයට ලක් වූ සේවකයින්ගේ සංගමයේ ලේකම්වරයාගේ අත්සනින් යුත් ලේඛනයෙහි 6 වන ඡේදය අනුව " රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවකයින්ගේ විශ්‍රාම යාමේ ක්‍රියාවලිය වූයේ වයස අවුරුදු 55 වෛකල්පිත විශ්‍රාම වයස සේ සලකා ඉන් පසු වසරින් වසර සේවා දිගු ලබා දෙමින් වයස 60 සපිරුණු තැන විශ්‍රාම ගැන්වීමයි. වයස 55 සිට 60 යන කාලය බලෙන් විශ්‍රාම ගැන්වීම ද අධිකාරිය අනුගමනය කළ බවය.

(iv) රාජ්‍ය මැණික් සංස්ථාවේ සිට අන්තර්ග්‍රහනය කරන ලද සේවකයින්ට නිකුත් කරන ලද පත්වීම් ලිපියේ 7.1 අනුව මැණික් සංස්ථාව සමග බැඳී ගිවිසුම් අධිකාරිය සමග ද බැඳී පවත්නා බවත් ඒ සමගම වයස 60 දක්වා සේවය කිරීමේ අයිතිය අධිකාරිය යටතේ ද පවතින බව ගම්‍ය වන බවත්,

(v) අධිකාරියට බඳවා ගන්නා විට අදාළ සේවක පිරිස වෙත නිකුත් කළ " NGJA/ 4/ 2/ Appoint " පත්වීම් ලිපියේ සඳහන් නොවීමෙන් රාජ්‍ය මැණික් සංස්ථාවේ සේවකයන් භුක්ති විඳින ලද ප්‍රතිලාභ භුක්ති විඳීමේ අයිතියෙන් නෛතිකව ඉවත් කර ඇති බව පිළිගැනීම,

(vi) සී/ ස ලංකා සළුසල ඒ. වික්‍රමනායක නඩුවේ තීන්දුව මෙතනටද බලපාන බව,

(vii) දෙවන වගඋත්තරකාර පාර්ශවය රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 52 හා ඊට වැරදි ලෙස විග්‍රහ කර ඇති බව,

(viii) P 4 ලෙසින් සලකුණු කොට ඉල්ලුම්කරුවන් විසින් ඉදිරිපත් කරන්නට යෙදුනු "1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතෙහි තම සේවකයින් විශ්‍රාම ගැන්වීමේ වයස පිළිබඳ ප්‍රතිපාදනයක් නොපෙනේ.

මෙසේ කරුණු රාශියක් මෙම ආරවුල සජීවී බව ගෙන හැර දැක්වීම සඳහා ඉල්ලුම්කරුවන්ද යත්න දරා ඇති බව පෙනේ. දෙපාර්ශවයේ කරුණු අතරින් බේරුම්කරණය යුක්ති සහගත හා සාධාරණ ලෙස සැලකිය හැකි කරුණු මෙසේ ගෙන හැර පෑ හැකි ය.

එනම්,

(i) මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරුවන් පස් දෙනාගේ පැමිණිල්ල වෙනත් කම්කරු කාර්යාලයක විමසමින් පවත්නා බව,

(ii) ඇතැම් ඉල්ලුම්කරුවන් වෙනත් අධිකරණයන්හි තීන්දු තීරණ මත සහන ලබා තිබීම.

(iii) රාජ්‍ය ව්‍යාපාර / දෙපාර්තමේන්තු චක්‍රලේඛ මත සේවකයින් විශ්‍රාම ගැන්වීමට කටයුතු කළ බව,

(iv) සේවකයන් බඳවා ගැනීම, විනය පරිපාලනය, විශ්‍රාම ගැන්වීම යන කරුණු කෙරෙහි විධිමත් බලය ස්වර්ණාභරණ අධිකාරයේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය සතු බව,

(v) දෙපාර්ශවයේ කරුණු අතරින් වගඋත්තරකාර ස්වර්ණාභරණ අධිකාරිය ගත් විරෝධතාවය තුළ යුක්ති සහගත හා සාධාරණ කරුණු මෙම යොමුවේ ඇති කරුණු විභාගයකින් තොරව ඉවත දැමීම සඳහා යොදා ගැනීමට තීරණය කළෙමි.

(vi) ඉල්ලුම්කරුවන්ගේ ලිඛිත දේශනය සමග " P5 " යන්න අමුණා ඇති 2016.07.16 හා රැස්වීම් අංක 163/ 2010/ 05 හා අයිතම අංක 2 දරන මාණ්ඩලික පත්‍රිකාව මෙහිදී වැදගත් ලේඛනයක් ලෙස ගෙන හැර දැක්විය. එහි මාතෘකාව " Matters Arising From the minuts BEYOND THE AGE OF 57 YEARS ( board paper 981)

It was decided that the retirement age of an employee is 55 years and no further extention of service beyond the age 55 would be granted" මාණ්ඩලික පත්‍රිකාව ඉල්ලුම්කරුවන්ගේ වාසියට යොද ා ගත නොහැක.

ඉල්ලුම්කරුවන්ගේ ලිඛිත දේශනයෙහි අවසානයේ ඉල්ලා ඇති සහන මෙසේ ය.

1. මෙම සේවකයින් 5 දෙනාට වසර 60 වන තෙක් ඔවුන් අවසානයට ලැබූ මූලික වැටුප වයස අවුරුදු 60 සැමරීමට ඉතිරිව තිබෙන වසර ගණනින් වැඩි කොට වන්දියක් ලෙස ලබාදීම.

2. සේවයේ නොසිටි කාලය තුළ දී තම සමකාලීන නිලධාරීන්ට ප්‍රද ානය කරනු යම් උසස්වීමක් ඇද්ද එය ඒ ආකාරයෙන් මොවුන්ටද ලබාදීම ආදියයි.

3. එහෙත් විශ්‍රාම ගන්වා ඇති මෙම ඉල්ලුම්කරුවන් වන

බී. එච්. එච්. බී. බස්නායක
කේ. ඩී. සුනිල් සමරසිංහ
කේ. එස්. පෙරේරා
ජේ. එච්. දයාසේන

ජී. ඒ. ජයරත්න යන අයට වයස අවුරුදු 60 දක්වා සේවය කිරීමට අවස්ථාව තිබියදී ඊට පෙර ඔවුන් විශ්‍රාම ගැන්වීමෙන් ඔවුන්ට යම් අසාධාරණයක් සිදු නොවූ බවත් ඒ අනුව ඔවුන්ට යම් සහනයක් හිමි නොවන බවත් පැහැදිලියි.

ඉල්ලුම්කරුවන්ගේ ලිඛිත දේශනය සමඟ අමුණා ඇති "ඇමුණුම 01" (ගොනුවේ 49 පිටුව) හි 13 වගන්තිය ප්‍රකාරව සියළු සේවකයින් "මීට කලින් සේවකයෙකු හට කරන ලද සේවයක් පිළිබඳව පැන නගින අයිතිවාසිකම්, වරප්‍රසාද හා ලාභ ප්‍රයෝජනාදියක් සම්බන්ධයෙන් ඔබට හිමිකම් ඉල්ලීමක් ගැන අධිකාරිය වග කියනු නොලැබේ." යන සේවා කොන්දේසිය මෙම ඉල්ලුම්කරුවන් කෙරෙහි බලපවත්නා බැව් පිළිගනිමි. පත්වීම භාර ගන්නා අවස්ථාවෙහි සේවකයන් පිළිගන්නා කොන්දේසි 17 ක් පවතී. ඒවාට එකඟව පත්වීම භාරගත යුතු ය.

තව ද මෙම ඉල්ලුම්කරුවන් වෙත අධිකාරිය විසින් සේවකයා විශ්‍රාම ගන්නා දිනයට මසකට පෙර විශ්‍රාම ගැන්වීම පිළිබඳව කරන ලද දැන්වීම කෙරෙහි සිහි කැඳවමි. උදා ජී. ඒ. ජයරත්න මහතා 2012.08.13 දින විශ්‍රාම ගන්වන බැව් 2012.07.12 දින එනම් මසකට පෙර දන්වා ඇත. ලිඛිත දේශනයේ 64 පුටුව හා ගොනුවේ 224 පිටුව බලන්න.

ඒ අනුව 2012 සිට 2018 අගෝස්තු දක්වා නිහඬව සිටීම මෙම නඩු නිමිත්ත අභාවයට යාමට ඉඩ හැරි කාලයක් ගත වූ බව කිව හැක.

තව ද ඉල්ලුම්කරුවන් විසින් සිය ලිඛිත දේශනය සමඟ ඉදිරිපත් කරන ලද X4 නම් ලේඛනය (76 පිටුව) ප්‍රකාරව රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයන් විශ්‍රාම ගැන්වීමේ වයස යන කරුණ යටතේ 1.) රාජ්‍ය ව්‍යවසායන්හි නිලධාරීන් වෛකල්පිත විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 55 විය යුතු යැයි ලිඛිතව උපදෙස් දී ඇත. 2011.04.29 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ ලිපිය උපදෙස් දේ. එකී උපදේශය සියළු අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත භාණ්ඩාගාරයේ ලේකම් විසින් දන්වන ලද එකකි.

"වයස අවුරුදු 57 ඔබ්බට අවුරුදු 60 දක්වා සේවකයා ඉල්ලීමක් කරන අවස්ථාවක දී එම ආයතනය සඳහා වන සේවා අවශ්‍යතාවය හා සේවකයාගේ කාර්ය සාධනය යන කරුණු සැලකිල්ලට ගෙන වසරින් වසර සේවා දිගුවක් ලබා දීමට අදාල රාජ්‍ය ව්‍යවසායකයාගේ පාලක මණ්ඩලයට ක්‍රියා කළ හැකි ය."

මේ අනුව ඉහත ඉල්ලුම්කරුවන් කෙරෙහි යම් සේවා දිගුවක් ලබා දිය හැකි ද? ඒ අවස්ථාව කල් පැන ගිය බව තේරුම් ගත යුතු ය. තව ද මෙම ලිපියේ ක්‍රියා කළ හැකිය යන්නෙන් ගත යුත්තේ යන්නට මෙම බේරුම්කරණයේ පිළිතුර වනුයේ "නැත" යන්නයි.

එසේ නම් ඔවුන්ට හිමි විය යුතු සහනයන් කවරේ ද? යන්නට පිළිතුරු "කිසිවක් නැත" යන්න වේ.

ඒ අනුව යොමුවේ සඳහන් කරුණ කිසිදු විභාගයකින් තොරව, මූලික විරෝධතා පිළි ගැනීමෙන් පසුව ඉවතලන ලදී.

මෙය සාධාරණ හා යුක්තිසහගත තීරණයක් බැව් සහතික කරමි.

දිනය : ජනවාරි මස 23 වැනි දින. බේරුම්කරු.

04-56

---

මගේ අංක - IR / 07/ 10/ 2013

## කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.09.01 දිනැති හා අංක 1878/7 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.08.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් අවිස්සාවේල්ල, සීතාවක, මාලිගාව මාවත, අංක 26 හි පිහිටි ලංකා වතු සේවා සංගමය (ජේ. එම්. එස්. බණ්ඩාර මයා වෙනුවෙන්) හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 06, කිරුළපන ඇවනිව්, අංක 54 හි පිහිටි ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.11.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර
කම්කරු කොමසාරිස් ජනරාල්

2019 මාර්තු මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව.
කොළඹ 10.

**කාර්මික අධිකරණයේ දී ය.**

ලංකා වතු සේවා සංගමය,
(ජේ. එම්. එස්. බණ්ඩාර මයා. වෙනුවෙන්)
අංක 26, මාළිගාව මාවත,
සීතාවක,
අවිස්සාවේල්ල.

නඩු අංකය ඒ. 3582

හා

ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 54, කිරුළපන ඇවිනිව්,
කොළඹ 06.

අතර කාර්මික ආරවුල.

**ප්‍රදානයයි**

1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් ඉහත නම් සඳහන් පාර්ශවකරුවන් අතර වූ කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2014.08.19 වන දින කාර්මික අධිකරණයට යොමු කරන ලදී.

කම්කරු කොමසාරිස්වරයා විසින් 2014.08.27 දින මෙම නඩුවට ගොනුකර ඇති ලිපිය අනුව මෙම කාර්මික ආරවුලට හේතු වී ඇති කරුණ වන්නේ "ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනයට අයත් උඩබාගේ වත්තේ සේවය කර මේ වනවිට විශ්‍රාම ලබා සිටින ජේ. එම්. එස්. බණ්ඩාර මහතාට වර්ෂ 1997 ජනවාරි මස සිට වර්ෂ 2011 අප්‍රේල් මස දක්වා කාලයට අදාලව ගෙවල් කුලී දීමනාව ලැබීමට හිමිකම් ඇත් ද යන්න සහ එලෙස හිමිකම් ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව ය.

මෙම කාර්මික ආරවුලට හේතු වී ඇති කරුණු පිළිබඳ ව විස්තර ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරීවරයා විසින් 2014.09.23 දාතමින් යවන ලද ලිපි මගින් දෙපාර්ශවයට දන්වා යවා ඇති අතර ලංකා වතු සේවා සංගමය 2014 ඔක්තෝබර් මස 01 වන දින (එම ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ 2004 ඔක්තෝබර් 01 යනුවෙනි) විස්තර ප්‍රකාශයක් ද ඒ සමග P1 සිට P4 දක්වා ලේඛනද ඉදිරිපත් කරන ලද අතර "ලලාන් රබර් ප්‍රයිවට් ලිමිටඩ්" ආයතනයේ මානව සම්පත් කළමනාකරු විසින් "කම්කරු කොමසාරිස්තුමියගේ අවධානය පිණිසයි" යනුවෙන් සඳහන් කරමින් විස්තර ප්‍රකාශයක් ද ඇමුණුම් 1 සිට ඇමුණුම් 7 දක්වා වූ ලේඛනද ගොනු කර ඇත.

ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් කර ඇති විස්තර ප්‍රකාශයේ සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු උඩබාගේ වතුයායේ සේවය කරමින් සිටිය දී වර්ෂ 1997 දෙසැම්බර් 01 වන දින සිට බලපවත්වන පරිදි එම වතුයායට අයත් අයිලා ඒකකයට මාරුකර යවන ලද ලිපියේ නිල නිවාසයක් ලබාදෙන බව සඳහන් වුව ද එය ලබා නොදුන් බවත්, නිල නිවාසයක් ලබාදෙන ලෙස වාචිකව ඉල්ලා සිටිය ද එය නොලැබුණ බවත් ය. එසේම එම ප්‍රකාශයේ වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු සාමාජිකත්වය දරණ ලංකා වතු සමාගම සේවා සංගමයේ මැදිහත්වීමෙන් පසු වතු සමාගම ඉල්ලුම්කරුට 2011 මැයි, ජුනි, ජූලි, අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර් යන මාස සඳහා හිඟ නිවාස ලබාදුන් බවත්, ඒ මගින් ඉල්ලුම්කරු නිවාස කුලිය ලබාගැනීමට සුදුසු අයෙකු බව සේව්‍ය පාර්ශවය පිළිගෙන ඇති බවත් ය. ඉල්ලුම්කරුට හිඟ ගෙවල් කුලිය වශයෙන් රුපියල් 1,19,430/ - ක මුදලක් ගෙවීම අවිස්සාවේල්ල කම්කරු කොමසාරිස් කාර්යාලයේ පැවති පරීක්ෂණයකදී නිර්දේශ කර ඇති බව ද එම මුදල ගෙවීම ලලාන් රබර්ස් (පෞද්ගලික) සමාගම පැහැර හැර ඇති නිසා එම මුදල අයකරදීමට කටයුතු කරන ලෙස එම ප්‍රකාශයේ වැඩිදුරටත් ඉල්ලා ඇත.

මෙම ආරවුල සම්බන්ධයෙන් "ලලාන් රබර්ස් ප්‍රයිවට් ලිමිටඩ්" දරන ස්ථාවරය එම සමාගම වෙනුවෙන් ගොනුකර ඇති විස්තර ප්‍රකාශයේ දක්වා ඇත. ඉල්ලුම්කරු සේවා ගිවිසුම අනුව ලබාදෙන ලද නිවසේ පදිංචිව සේවයට වාර්තා කළ යුතු වුවත්, එසේ නොකළ නිසා 1995 වසරේ දී නිදහසට කරුණු විමසන ලද බවත් පුද්ගලික හේතු මත නිල නිවසේ පදිංචියට පැමිණීමට නොහැකි බව ඉල්ලුම්කරු දන්වන ලද බවත් ය. පිරිනමන ලද නිල නිවසේ පදිංචි නොවන සේවකයෙකුට විනය ක්‍රියාමාර්ගයක් ගතයුතු වුවත් සානුකම්පිත හේතුමත එවැනි ක්‍රියාමාර්ගයක් නොගත් බව සමාගම සිය විස්තර ප්‍රකාශයෙන් දක්වා ඇත. කරුණු එසේ තිබිය දී ඉල්ලුම්කරු විසින් කරනු ලබන ඉල්ලීම "නීත්‍යානුකූල නොවනවා පමණක් නොව සාධාරණ හා යුක්තිසහගත නොවන බව" සමාගමේ ස්ථාවරය වී ඇත. කෙසේ වුවද එම විස්තර ප්‍රකාශයේ පිළිගෙන ඇති කරුණක් වන්නේ ඉල්ලුම්කරුට 2011 මැයි මස සිට ඔහු විශ්‍රාම ගිය 2011.10.23 තෙක් නිවාස කුලී දීමනා ගෙවන ලද බවයි.

2015.05.21 වන දින කාර්මික අධිකරණය හමුවේ සාක්ෂි ලබා ගැනීම ආරම්භ කරන ලදී. එදින ඉල්ලුම්කරු වන ජේ. එම්. එස්. බණ්ඩාර මහතා ද ඔහු නියෝජනය කරමින් ඩී. වීරසූරිය මහතා ද පෙනී සිටියහ. ලලාන් රබර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනට නියෝජනය කරමින්

ජ්‍යෙෂ්ඨ සමූහ කළමනාකාර රංග අලහකෝන් මහතා නඩු විභාගයට සහභාගී වූ අතර එම සමාගම වෙනුවෙන් නීතිඥ අනුරාධ කදන්හේන .මහතා පෙනී සිටියහ. මූලික සාක්ෂිය ලබාදෙමින් ඉල්ලුම්කරු ප්‍රකාශ කළේ උඩබාගේ වතුයායේ සේවය කරමින් සිටියදී 1997.12.01 සිට බලපැවැත්වෙන පරිදි එම වතුයායේ අයිලා ඒකකයට මාරු කර යවන ලද බවත් නිල නිවාසයක් ලබාදෙන බව අදාළ ලිපියේ සඳහන් වූවත් නිල නිවසක් ලබා නොදුන් බවත් ය. ඉල්ලුම්කරු සාක්ෂි දෙන අවස්ථාවේ ලේඛන හතරක් ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

ඒ 1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ 1996.09.20 දාතමින් ඉල්ලුම්කරු ලිපිකරු හා ගබඩා භාරකරු තනතුර ලබාදෙන බව සඳහන් ලිපියයි. එම ලිපියේ නිල බංගලාවක් සපයන බව දැක්වෙන කොටස ඒ1ඒ ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඒ2 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ 1997.12.01 වන දින සිට ඉල්ලුම්කරු අයිලා කොටසට මාරු කරන ලදි සඳහන් ලිපියයි. නිල නිවාසයක් ලබාදෙන බවට එම ලිපියේ සඳහන් කොටස ඒ2ඒ ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලදී. ඒ3 ලෙස ලකුණු කරන ලද ලිපිය නිවාස කුලිය ගැන සඳහන් කරමින් 2004.05.06 වන දින අයිලා කොටසේ කළමණාකරු විසින් ඉල්ලුම්කරු වෙත එවන ලද්දකි. එම ලිපිය ඉල්ලුම්කරු විසින් කළමණාකරු වෙත 2004.04.24 වන දින යවන ලද ලිපියට පිළිතුරු වශයෙන් එවන ලද්දකි. ඉල්ලුම්කරු වෙනුවෙන් හරස් ප්‍රශ්න අසමින් සේව්‍ය සමාගම ලේඛන කිහිපයක් ලකුණු කර ඉදිරිපත් කරන ලදී. R1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ 1989.04.17 වන දින ඉල්ලුම්කරුට යවන ලද ලිපියයි. එම ලිපිය යවා ඇත්තේ ඉල්ලුම්කරු ඒ වනවිට සේවය කර මියන වත්තේ වතු පාලක විසිනි. වහා ක්‍රියාත්මක වන පරිදි ඉල්ලුම්කරුට නිල නිවසක් ලබාදෙන බව එම ලිපියේ සඳහන් වේ. R2 ලෙස සඳහන් කරන ලද්දේ මියන වත්ත ඒකකයේ කළමනාකරු 1995.02.07 වන දින ඉල්ලුම්කරු වෙත යවන ලද ලිපියකි. එම ලිපියේ සඳහන් වන්නේ ඉල්ලුම්කරු පුරුද්දක් වශයෙන් පමාවී සේවයට පැමිණෙන බව හා ලබාදෙන ලද නිල නිවස පාවිච්චියට නොගැනීම සම්බන්ධයෙනි. එම කරුණ සම්බන්ධයෙන් ලිඛිතව කරුණු දක්වන ලෙස එම ලිපිය මගින් ඉල්ලුම්කරුට දන්වා ඇත. R3 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ ඉල්ලුම්කරු එම ලිපියට පිළිතුරු වශයෙන් 1995.02.07 වන දින කළමනාකරු වෙත යවන ලද ලිපියයි. ඉල්ලුම්කරු එම ලිපියේ සඳහන් කර ඇත්තේ පුද්ගලික අපහසුතාවයන් නිසා සිය නිවසේ සිට සේවයට පැමිණෙන බවත් තමා වෙත වෙන් කරන ලද නිල නිවස වෙනත් සේවකයෙකුට ලබාදීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොදක්වන බවත් ය.

ඉල්ලුම්කරු මෙම අධිකරණය හමුවේ සාක්ෂි දී ඉල්ලුම්කරු වෙනුවෙන් සාක්ෂි කැඳවීම අවසන් කර සේව්‍ය පාර්ශවය වෙනුවෙන් සාක්ෂි කැඳවීමට තිබියදී අධිකරණයට වාර්තාවූයේ ඉල්ලුම්කරු මියයන ලද බවත් ය. සේව්‍ය පාර්ශවයේ සාක්ෂි ලබා ගැනීම සඳහා මෙම නඩුව කැඳවූ අවස්ථාවේ එම පාර්ශවය වෙනුවෙන් ප්‍රකාශ කළේ ඉල්ලුම්කරු මියගොස් ඇති නිසා මෙම නඩුව තවදුරටත් පවත්වාගෙන යා නොහැකි බවය. ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කළේ මෙම නඩුව තවදුරටත් පවත්වාගෙන යා හැකි බව ය. එම කරුණ සම්බන්ධයෙන් ලිඛිතව කරුණු ඉදිරිපත් කිරීමට දෙපාර්ශවයට දන්වා සිටි අතර අනතුරුව 2017.12.08 වන දින ඒ පිළිබඳ නියෝගය ප්‍රකාශයට පත් කළෙමි. ඉල්ලුම්කරු මියයන අවස්ථා වනවිට ඉල්ලුම්කරු වෙනුවෙන් සාක්ෂි කැඳවිම අවසන් කර සේව්‍ය පාර්ශවයේ සාක්ෂි කැඳවීමට නියමිතව තිබූ නිසා ඉල්ලුම්කරු වෙනුවට ඔහුගේ බිරිඳ ආදේශ කර මෙම නඩුව තවදුරටත් පවත්වාගෙන යා හැකි බව තීරණය කළෙමි. 2018.05.02 වන දින නැවත විභාගය ආරම්භ කරන ලද අතර එදින සේව්‍ය පාර්ශවය වෙනුවෙන් උඩබාගේ වතුයායේ කළමනාකාර සුමනසේකර මහතා සාක්ෂි දී ඔවුන්ගේ නඩුව අවසන් කරන ලදී. අනතුරුව දෙපාර්ශවය විසින් ලිඛිත දේශන ගොනු කරන ලද අතර ඉදිරිපත් කරන ලද විස්තර ප්‍රකාශ ද ලකුණු කරන ලද ලේඛනද, සාක්ෂිද, ලිඛිත දේශනද කෙරෙහි අවධානය යොමු කළෙමි.

ඉල්ලුම්කරු වෙනුවෙන් ඒ1 ලෙස ලකුණු කර ඉදිරිපත් කරන ලද්දේ ඉල්ලුම්කරු 1996.09.20 වන දින සිට ලිපිකරු/ ගබඩා භාරකරු තනතුරට පත් කරන ලද පත්වීමේ ලිපියකි. එම ලිපියේ දැක්වෙන ආකාරයට ඉල්ලුම්කරු ලිපිකරු තනතුරට මෙන්ම ගබඩා භාරකරු තනතුරට පත් කිරීමටද පාලන අධිකාරිය තීරණය කර ඇත. ඒ1ඒ ලෙස සඳහන් කොටසේ සඳහන් වන්නේ ඉල්ලුම්කරුට නිල බංගලාවක් ලබාදෙන බවය. නව පත්වීමක් ලැබූ ඉල්ලුම්කරුට 1996.09.20 දිනෙන් පසු නිල නිවාසයක් ලබාදුන් බව හෝ එසේ නිල නිවසක් ලබා දුන්නේ නම් එම නිල නිවසට ඉල්ලුම්කරු නොපැමිණි බව සනාථ කරන ලේඛනයක් හෝ සේව්‍ය සමාගම වෙනුවෙන් ඉදිරිපත් කළේ නැත. R1, R2, R3 ලෙස ලකුණු කළ ලිපි අදාළ වන්නේ ඉල්ලුම්කරුගේ නව පත්වීමට පෙර 1989 සිට 1996 කාලවකවානුවටය. 1996.09.20 දිනට පසු මෙම කරුණට අදාළව සේව්‍ය පාර්ශවය ඉදිරිපත් කළ එකම ලේඛනය වන්නේ R5 ලෙස ලකුණු කළ ලිපියයි. උඩබාගේ වත්තේ කළමනාකරු විසින් 2004. 05.06 වැනි දින ඉල්ලුම්කරු වෙත යවන ලද එම ලිපිය ඉල්ලුම්කරු විසින් නිවාස කුළිය ගැන සඳහන් කරමින් 2004.04.24 වන දින යවන ලද ලිපියට පිළිතුරු වශයෙන් යවන ලද්දකි. එම ලිපියේ සඳහන් වන්නේ නිල නිවසක් ලබා ගැනීම සඳහා උඩබාගේ වත්තේ අයිලා කොටසේ කළමනාකරු මුන ගැසෙන ලෙසය. ඉන් පැහැදිලි වන්නේ 1996.09.20 වන දින සිට 2004.05.06 දින වනවිටත් ඉල්ලුම්කරුට නිල නිවසක් ලබාදී නොමැති බවය. ඉල්ලුම්කරු සිය සාක්ෂියේදී සඳහන් කළේ A3 ලිපිය අනුව නිල නිවසක් ලබා ගැනීම සඳහා වතු කළමනාකරු මුණ ගැසුනද නිවාස නැහැ නිවාස හැදුවහම දෙන්නම් යැයි ඔහු ප්‍රකාශ කළ බව ය. ඉල්ලුම්කරු සඳහන් කරන ආකාරයට නිවාස කුලිය ඉල්ලා පාලන අධිකාරියට ලිපියක් යොමු කර ඇත්තේ ඉන් පසුව ය.

මෙම කාර්මික ආරවුලට තුඩුදී ඇති කරුණ වන්නේ ඉල්ලුම්කරුට 1997 ජනවාරි මස සිට 2001 මාසයේ අප්‍රේල් මාසය තෙක් ගෙවල් කුලිය ලබාදිය යුතුද යන්නයි. ඉල්ලුම්කරුගේ ගෙවල් කුලිය සම්බන්ධයෙන් ඉල්ලුම්කරු සාමාජිකත්වය දරන ලංකා වතු සේවා සංගමයේ මැදිහත්වී කරන ලද සාකච්ඡාවකින් පසු 2011 වර්ෂයේ මැයි, ජුනි, ජූලි, අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසය සඳහා ඉල්ලුම්කරුට ගෙවල් කුලිය ගෙවීමට වතු සමාගම කටයුතු කළ බව ය. ඒ මගින් ඉල්ලුම්කරු ගෙවල් කුලිය ලැබීමට සුදුසු පුද්ගලයෙකු බව වතු සමාගම පිළිගෙන ඇති බව ඉල්ලුම්කාර පාර්ශවය වෙනුවෙන් තර්ක කළේය. එම මාස සඳහා ගෙවල් කුලී ගෙවූ බව පිළිගන්නා ලද නමුත්, එසේ එම මුදල ගෙවන ලද්දේ දෙපාර්ශවය අතර ඇති වූ පූර්ණ හා අවසන් සමථයක් වශයෙන් බවයි ඊට පිළිතුරු දෙමින් සේව්‍ය පාර්ශවය වෙනුවෙන් ප්‍රකාශ කර සිටියේ. ඉල්ලුම්කරු සාක්ෂි දෙන අවස්ථාවේ A4 ලෙස සලකුණු කර සහකාර කම්කරු කොමසාරිස් විසින් ලංකා වතු සේවා සංගමයට එවන ලද ලිපියක් ඉදිරිපත් කරන ලදී. එම ලිපියේ සඳහන් වන්නේ

සාමූහික ගිවිසුම ප්‍රකාරව නිවාස කුලිය නොගෙවීම ජේ. එම්. එස්. බණ්ඩාර මයා. ඉහත පැමිණිලි පරීක්ෂණයේ දී ජේ. එම්. එස්. බණ්ඩාර නමැති අයට 1997 ජනවාරි සිට 2011 අප්‍රේල් දක්වා අයවිය යුතු නිවාස කුලිය අයකර ගැනීම සඳහා මා විසින් සේව්‍යයා මා වෙත නිවේදනයක් යවා ඇත. එම නිවේදනය ප්‍රතික්ෂේප කරමින් සේව්‍යයා මා වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත. ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා දෙපාර්ශවයට 2013.03.20 දින පෙ. ව. 10.30 ට කැඳවා ඇත. සහකාර කම්කරු කොමසාරිස් අවිස්සාවේල්ල යනුවෙනි.

එම ලිපියේ එකී පරීක්ෂණය පැවැත්වූවා ද එහි ප්‍රතිඵලය කුමක්ද යන්න පිළිබඳව මෙම විභාගයේ දී සාක්ෂියක් හෝ ලේඛනයක් කිසිදු පාර්ශවයක් ඉදිරිපත් කළේ නැත. ඉල්ලුම්කරු වෙනුවෙන් ගොනුකර ඇති ලිඛිත ප්‍රකාශනයේ සඳහන් කර ඇත්තේ අමුණා ඇති වගුවට අනුව ඔහුට හිමිවිය යුතු ගෙවල් කුලිය වන රුපියල් 1,19,430 ක මුදලක් ගෙවීම අවිස්සාවේල්ල සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලයේ පවත්වන්නට යෙදුන ඉතාමත් විධිමත් පරීක්ෂණයකින් අනතුරුව පාලක පක්ෂය වෙත සහකාර කම්කරු කොමසාරිස්තුමිය විසින් නිර්දේශ කර ඇති බැවින් එම මුදල ගෙවීම ලලාන් රබර්ස් පුද්ගලික සමාගම අද දක්වාම පැහැර හැර ඇති හෙයින් එම මුදල ලබාදීමට කාරුණිකවන මෙන් ය. කම්කරු කොමසාරිස් විසින් නිර්දේශ කළ මුදලක් අයකරදීමට මෙම අධිකරණ වගකීමක් හෝ බැඳීමක් නැත. මා නිගමනය කළ යුතු වන්නේ ඉදිරිපත් වී ඇති සාක්ෂි හා ලේඛන අනුව ඉල්ලුම්කරුට අදාළ කාලය තුළ හිඟ නිවාස කුලිය ලැබීම සාධාරණ හා යුක්ති සහගතද යන්නයි. ඉල්ලුම්කරුට 2001 මැයි මස සිට 2001 ඔක්තෝබර් මාසය තෙක් නිවාස කුළිය ගෙවන ලද්දේ දෙපාර්ශවය අතර ඇති වූ පූර්ණ හා අවසන් සමථයක් අනුව බව සේව්‍ය පාර්ශවය ප්‍රකාශ කලද ඒ බව සනාථ කරන කිසිදු ලේඛනයක් ඉදිරිපත් කිරීමට එම පාර්ශවය අසමත් විය. 1996 ජනවාරි මස සිට 2011 අප්‍රේල් මස තෙක් හිඟ නිවාස කුළිය ගනනය කරමින් ඉල්ලුම්කර පාර්ශවය ඉදිරිපත් කර ඇති ලේඛනය කෙරෙහි අවධානය යොමු කළෙමි. ඉල්ලුම්කරුට එම කාලය සඳහා හිඟ නිවාස කුළියක් ලැබීම සාධාරණ හා යුක්ති සහගත බව තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කරු වෙනුවෙන් ඉල්ලුම්කරුගේ භාර්යාව වන ඒ. ජී. පුණ්‍යවතී මහත්මියට රුපියල් 1,19,430 ක මුදලද එම මුදල මත 1996 ජනවාරි මස සිට 2011 අප්‍රේල් මස දක්වා නෛතික පොළියද ප්‍රදානය කිරීමට තීරණය කරමි. මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළවී මසක් ඇතුළත ලලාන් රබර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ගෙවිය යුතු බවට ද තීරණය කරමි. ප්‍රදානය කරන ලද මුදල නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු වේ.

2018 නොවැම්බර් මස 30 වැනි දින බේරුම්කරු

04-57

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.